**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව,**
**හම්බන්තොට දිස්ත්‍රික්කය.**

---------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 10 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගිණුම් 04 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් හා පෙර වර්ෂයේ අවසන් ශේෂයන් අතර රු. 7,247,622 ක අඩු/වැඩිවීමක් පැවතුණි. | ආරම්භක ශේෂයන් නිවැරදිව ඉදිරියට ගෙන ආ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයන්හි බදු දී තිබූ කඩ කාමර 04 ක් වෙනුවෙන් ලැබිය යුතු එක්වන් මුදල් රු. 770,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | එක්වන් මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර වාර්තා කරන බව දන්වමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති රු. 530,471 ක් වූ වෙනත් ණයගැතියන් ගිණුම්ගත කර නොතිබුණි. | ණයගැතියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති සේවක ඇප තැන්පතු රු. 196,192 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | සේවක ඇප නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 71,718 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 6,998,021 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ලේඛන නිවැරදිව යාවත්කාලීන කර, වර්ගීකරණය කර, නිවැරදි ලේඛන වල ඇතුළත් කර නොතිබුණු අතර 2019 භාණ්ඩ සමීක්ෂණය මඟින් යම්තාක් දුරට නිවැරදි කර ඇති බව සහ 2020 වර්ෂයේ සිට විධිමත්ව පවත්වාගෙන යන බව දන්වා සිටිමි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) | | | |
| | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී අතිරික්තතා හා ඌනතා ප්‍රකාශනය ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | i. මු.රෙ. 571 | වසර 02ක ඉක්මවූ රු. 401,825 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වසර 02 ඉක්මවා ඇති තැන්පතු ආදායමට ගැනීමටත්, වසර දෙක නොඉක්මවූ තැන්පත් ඉදිරියේදී නිදහස් කිරීමටත් කටයුතු කරමි. |
| | ii. මු.රෙ.1645(අ) සහ 1646 (ඈ) | වාහන 10 ක දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කාර්යය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් ධාවන සටහන් ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බවත් ඉදිරියට මෙම අඩුපාඩුව සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සහ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මානව සම්පත් සැලැස්ම සැකසීමට උත්සාහ ගත්තද නිවැරදි අවබෝධයක් හෝ දැනුමක් කාර්යය මණ්ඩලයට නොමැති බවත්, මේ වන තෙක් ඒ සම්බන්ධ පුහුණුවක් හෝ කාර්යය සිදු කිරීමට අදාළ පැහැදිලි උපදෙස් ලැබී නොමැති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම, රු.229,620 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 542,256 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 330,000 | 309,920 | 311,720 | 1,300 | 351,000 | 407,739 | 412,239 | 2,500 |
| කුලී | 3,885,500 | 3,287,184 | 3,070,984 | 229,100 | 4,332,000 | 3,137,025 | 3,139,550 | 120,900 |
| බලපත්‍ර ගාස්තු | 575,100 | 769,260 | 531,760 | 2,100 | 505,100 | 1,596,200 | 1,565,000 | 55,200 |
| වෙනත් ආදායම් | 3,254,850 | 3,081,530 | 3,229,942 | 2,509,298 | 2,424,000 | 1,763,183 | 1,348,596 | 1,007,922 |
| එකතුව | 8,045,450 | 7,447,894 | 7,144,406 | 2,741,798 | 7,612,100 | 6,904,147 | 6,465,385 | 1,186,522 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ සඳහා වරිපනම් බදු තක්සේරු කර අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව වර්පනම් බදු තක්සේරු කර අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කඩිනමින් දේපල ලයිස්තු සකස් කර ප්‍රධාන තක්සේරු කරු වෙත යොමු කිරීමට කටයුතු කරමි. |

**2.2.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 28 කින් ලැබිය යුතු කඩ කාමර කුලී සහ ප්‍රමාද ගාස්තු පිළිවෙලින් රු. 229,100 ක් හා රු. 22,910 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කිරීම සඳහා මහසභාවට තොරතුරු ඉදිපත් කර ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | කඩ කාමර කුලී සඳහා තක්සේරු විරෝධතාවයෙන් පසු ලද තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරුව මත කඩ කුලී අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 142(5) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ නව තක්සේරුව 2019 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කිරීමට මහා සභාව විසින් ඒකමතිකව තීරණය කර ඇති බැවින් එම තීරණය පරිදි ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ලුණුගම්වෙහෙර නව නගර කඩ කාමරයක් රු. 2,000 බැගින් 2015 සැප්තැම්බර් 21 දින තක්සේරු කර තිබුණත් ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟතාවය මත මාසික කඩ කුලිය රු. 1,000 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසය දක්වාම අයකර තිබුණි. | තක්සේරු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2015 සිට 2018 වර්ෂය දක්වා මාසික කඩ කුලිය රු. 1,000 බැගින් අය කිරීමට ප්‍රධාන අමාත්‍යවරයා අනුමත කර ඇති බව සහ සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසය දක්වාත් රු. 1,000 බැගින් එලෙසම මාසික කඩ කුලිය අයකර ඇති බව දන්වමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ පිහිටි වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ස්ථාන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර 2017 වර්ෂයේ සමීක්ෂණය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදීත් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර තිබුණි. | ව්‍යාපාර ස්ථාන හඳුනා ගැනීමට සමීක්ෂණයක් සිදු කිරීම හා හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී ආදායම් පරීක්ෂක නිලධාරියෙකු නොසිටි බවත් 2020 වර්ෂය සඳහා සමීක්ෂණය සිදු කර ඇති බව සහ ඒ අනුව මෙම වර්ෂයේ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 102,507 ක් හා රු. 643,000 ක් විය. තවද ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය තුළ වර්ෂ 01 ත් 03 ත් අතර හිඟ ශේෂය රු. 458,500 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මුද්දර ගාස්තු හිඟයෙන් රු. 619,500 ක් ලැබී ඇති බවත් හිඟ උසාවි දඩ මුදල සම්පූර්ණයෙන්ම ලැබී ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක්ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කරුණු 28 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා කාරණා 28 ක් වැළඳගෙන ඇති බව දන්වමි. |

#### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ආයතනය තිරසර සංවර්ධන අරමුණු විෂය පථයට අදාළව කරුණු 05 ක් හඳුනාගෙන ඇති බව සහ 2020 අයවැය මඟින් එම දර්ශක හඳුනා ගැනීම හා ඉලක්ක වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදය සකස් කර ඉදිරිපත් කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර 2017 වර්ෂයේ සමීක්ෂණය පදනම් කරගෙන ගාස්තු අයකර තිබුණි. | දැන්වීම් පුවරු සමීක්ෂණයක් වාර්ෂිකව සිදු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂක වරයෙකු නොසිටි බැවින් සමීක්ෂණයක් සිදු කිරීමට නොහැකි වූ බව සහ 2020 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදු කර ඇති බව දන්වමි. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය අනුව සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වෛද්‍ය නොතාරිස් හා රෙජිස්ටාර් වැනි වෘත්තීන් වලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂකවරයෙකු නොසිටි බැවින් වෘත්තීයවේදීන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොමැති අතර 2020 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා කර්මාන්ත බදු අය කිරීමට සභා බල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර 2017 වර්ෂයේ සමීක්ෂණය පදනම් කරගෙන බදු අයකර තිබීමෙන් අළුතින් ස්ථාපිත කර්මාන්ත සඳහා බදු අයකර නොතිබුණි. | පනත ප්‍රකාරව ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉකුත් හා සමාලෝචිත වර්ෂවල ආදායම් පරීක්ෂකවරයෙකු නොසිටි බැවින් 2017 වර්ෂයේ සමීක්ෂණය පදනම් කරගත් බවත් 2020 වර්ෂය සඳහා කර්මාන්ත බදු සමීක්ෂණයක් සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ඈ) | 1993 ජුනි 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ නියමයන් පරිදි ලබාගත යුතු පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා ලබාගෙන නොමැති ව්‍යාපාර ස්ථාන 16 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය සඳහා පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තා ලබාගත් ව්‍යාපාර ස්ථාන 24 කට අදාළව එම ආයතන වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට උනන්දු කරවීමට සභාව කටයුතු නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නවක විෂය නිලධාරිනියක් සිටි නිසාත්, ආයතනයේ නිලධාරීන්ට මේ සම්බන්ධව නිසි දැනුමක් නොමැති වීම නිසාත්, මෙම අඩුපාඩුව සිදු වී ඇති බව සහ මෙම වර්ෂය තුළදී අඩුපාඩුව සිදු නොවීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 08 ක් හා අතිරික්තතා 04 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සේවක සංඛ්‍යාවෙන් 04 ක් සම්පූර්ණ කර තවත් පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීමට අනුමැතියට යවා ඇති බවත්, ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව සහ අතිරික්ත තනතුර විධිමත් කිරීමට කටයුතු කරන බවත්, 25/2014 චක්‍රලේඛය මඟින් තනතුරු 04 ක් ඔවුන්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බව දන්වමි. |

### (ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 75,416 ක් ඇපකරුවන්ගෙන් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ණය ශේෂයෙන් රු. 10,000 ක් අය කර ගෙන ඇති අතර 36,966 ක මුදලක් කපා හැරීමටත් ඉතිරි දෙදෙනාගේ ණය ශේෂ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමටත් කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් සංවර්ධන යෝජනා 22 ක් සඳහා රු. 22,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ගත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුවේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මධ්‍ය රජය සහ පළාත් සභා ප්‍රතිපාදන නොලැබුණු බැවින් උපයන ලද ආදායම සංවර්ධන කටයුතු සඳහා වියදම් දැරීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වා සිටිමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් බුක්ති විදින ඉඩම් 07 ක, සුසාන භූමි 20 ක, ප්‍රජා ශාලා ඉඩම් 24 ක, ගොඩනැගිලි 10 ක සහ වාහන 04 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීමට ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇති අතර මැනුම් කිරීම සඳහා මූල්‍යමය ශක්තියක් නොමැති බවත්, ගාස්තු අය කිරීමකින් තොරව සුසාන භූමි 04 ක් මැනුම් කිරීමට එකඟ වී ඇති බවත්, ඉතිරි බිම් කොටස් සඳහා ගාස්තු යටතේ මැනුම් කර ගැනීමට කටයුතු කරන බවත්, වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර ඇති බවත් එක් වාහනයක් ලීසිං ක්‍රමයටත් ලබා ගෙන ඇති බව දන්වමි. |

**3.5.2 නිශ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද බෙරලිහෙල සතිපොළ 2020 ජනවාරි 22 දින වන විටත් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම සති පොළෙහි විදුලිය, ජලය හා ආරක්ෂිත වැටක් නොමැති බවත්, පොළ භූමිය විධිමත් පරිදි සකස් කර නොමැති බවත්, අදාළ අඩුපාඩු සම්පූර්ණ කර ගෙන පොළ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව මඟින් නිර්දේශ කර තිබූ වීරවිල පොළ නවීකරණය කර සතිපොළ පවත්වා ගෙන යාමේ කාර්යය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. | ජල විදුලි සම්බන්ධතා නොමැතිවීමත් එම අඩුපාඩු ලබා ගෙන පොළ නවීකරණය කර පවත්වාගෙන යාමට සභා අනුමැතිය ලැබී ඇති බවත් 2020 වර්ෂයේ පොළ සංවර්ධනය සඳහා රු. ලක්ෂ 20 ක ප්‍රතිපාදන අනුමත වී ඇති බව සහ මේ වන විට ඇස්තමේන්තුද සකස් කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ වෙන්දේසි කරන ලද භාණ්ඩ වර්ග 07 කට අදාළව ඒකක 32 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉන්වෙන්ට්‍රි හා ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම නිලධාරීන් 03 දෙනෙකුට පවරා තිබීම නිසා මෙම කාර්යය නිසි පරදි සිදුව නොමැති බවත් මේ වන විට එක් නිලධාරියෙකුට අදාළ කටයුතු පවරා විධිමත්ව කරගෙන යන බව දන්වමි. |